# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1923/4 - 2015 ජූලි මස 13 වැනි සඳුදා - 2015.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### මැතිවරණ දෙපාර්තමේන්තුව

### දැන්වීමයි

### පාර්ලිමේන්තු මැතිවරණය - 2015

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) අනුව්‍යවස්ථාව සහ 104 ආ (5) (ඇ) (1) අනුව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සම්පත් අවභාවිතය වැලැක්වීම පිණිස සහ මැතිවරණය නිසිලෙස පැවැත්වීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ලබා ගැනීම පිණිස රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් වෙත නිකුත් කරනු ලබන විධාන.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 එ අනු ව්‍යවස්ථාවේ සඳහන් ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයෙකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා භාවිතා කිරීම, ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයෙකු හෝ දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් විසින් භාවිතා කිරීම, කොමිෂන් සභාවේ උපදෙස් මත කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මගින් තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට හිමි වන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (ආ) (4) (අ) අනුව්‍යවස්ථාවේ සඳහන් වී ඇති බැවින් ද කොමිෂන් සභාව සංස්ථාපනය කෙරෙන තෙක් එකී බලතල මැතිවරණ කොමසාරිස්වරයාට හිමිවන බව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 49 වන වගන්තියේ 3(අ) උපවගන්තියේ සඳහන් වී ඇති හෙයින් ද මැතිවරණ කොමසාරිස්, වඩුගේ වරුණසිරි මහින්ද දේශප්‍රිය වන මවිසින් මතු සඳහන් විධාන නිකුත් කරනු ලැබේ.

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල හා වෙනත් එවැනි රාජ්‍ය ආයතන, රාජ්‍ය බැංකු/රාජ්‍ය විශ්ව විද්‍යාල, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සමාගම්/සන්නද්ධ හමුදා ඇතුලු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් සෑම ආයතනයක්ම සන්තකයේ ඇති වාහන, උපකරණ, යන්ත්‍ර සූත්‍ර, සංචාරක බංගලා, නිවාඩු නිකේතන හා ගොඩනැගිලි ඇතුළු සියලුම චංචල හා නිශ්චල දේපළ සහ පෙර සඳහන් ආයතනවල සේවයේ නියුතු කිසිදු නිලධරයකු හෝ සේවකයකු පාර්ලිමේන්තු මැතිවරණයට තරඟ කරන කිසිදු දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා නැතහොත් අගතියට පත් කිරීම සඳහා කවර හෝ ආකාරයකින් නොයෙදවිය යුතුය. එසේ යොදා ගැනීමට කිසිදු දේශපාලනඥයකුට හෝ නිලධරයකුට හෝ වෙනත් පුද්ගලයකුට හෝ ඉඩ නොතැබිය යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මහජනතාවට සහන සැලසීම සඳහා හෝ මහජනතාව දැනුවත් කිරීමට රජයෙන් හෝ පළාත් සභාවලින් හෝ වෙනත් රාජ්‍ය ආයතනවලින් පවත්වනු ලබන ජංගම සේවා, වැඩමුළු, ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ, ශිෂ්‍යත්ව ප්‍රදාන, ආධාර හෝ සහනාධාර ප්‍රදාන කිරීමේ උත්සව, සමාරම්භක උත්සව, විවිධ සංවර්ධන ව්‍යාපෘති ජනතා අයිතියට පැවරීමේ හෝ විවෘත කිරීමේ උත්සව, ක්‍රීඩා තරඟ යනාදී කිසිවක් උපයෝගී කර ගනිමින් කිසිදු දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනයට හෝ අගතියකට පත්කිරීමට ක්‍රියා නොකළ යුතුය. යෝජිත එවැනි කාර්යයන් පිළිබඳව මැතිවරණ කොමසාරිස් වෙත වාර්තා කළ යුතු අතර කල් තැබිය නොහැකි තරම් හදිසි හෝ මැතිවරණයට බලපෑමක් නොවන බව පෙනී යන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ස්වාභාවික විපතක් හෝ හදිසි අනතුරක් හෝ හදිසි ආපදාවක දී ක්‍රියා කිරීම සඳහා මෙම නියමය අදාළ නොවන නමුදු එවැනි අවස්ථා වුව ද පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීමට ඉඩ නොදිය යුතුය.

එමෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයට අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වන දේශපාලනඥයන් කිසියම් නිල තනතුරක් දරන්නේ නම් ඔවුන් විසින් දරන නිලය හේතු කොට ගෙන අත්‍යවශ්‍යයෙන්ම සහභාගී විය යුතු රාජ්‍ය උත්සව සඳහා පමණක් එවැනි දේශපාලනඥයින් සහභාගී කරවා ගත හැකි අතර එවැනි කිසිදු උත්සවයක දී පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනයට හෝ අගතියට පත් කෙරෙන කාර්යයන් සිදු කිරීමට කිසිවෙකුට අවකාශ නොදිය යුතුය. මැතිවරණ කාලසීමාව තුළ දී පැවැත්වෙන සම්ප්‍රදායානුකූල නිල රාජ්‍ය උත්සව හැර සෙසු උත්සව පැවැත්වීමේ දී තරග කරන අපේක්ෂකයන් සහභාගී වන්නේ නම් ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් වෙත දන්වා එකඟතාව ලබා ගැනීමට උත්සව සංවිධානය කරන රාජ්‍ය නිලධාරීන් කටයුතු කළ යුතුය.

ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව කෙරෙන හෝ ව්‍යවස්ථාමය නියමයන් මත කෙරෙන හෝ පාර්ලිමේන්තු අණපනත් මගින් නිශ්චිතව නියම කර ඇති විධිවිධාන අනුව කෙරෙන බඳවා ගැනීම්, පත්වීම්, උසස්වීම් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ විධිමත් ලෙස ප්‍රසිද්ධ දැන්වීම් හෝ ගැසට් නිවේදන මගින් ඉල්ලුම්පත්‍ර කැඳවා කරනු ලබන බඳවා ගැනීම්, පත්වීම්, උසස්වීම් හැර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් සෑම රාජ්‍ය ආයතනයක්ම මැතිවරණ කාල සීමාව තුළ මැතිවරණ කොමිෂන් සභාවේ නැතහොත් මැතිවරණ කොමසාරිස්ගේ නිසි අවසරයක් නොමැතිව කිසිම ආකාරයක සේවයට බඳවා ගැනීම්, පත්වීම් ලබාදීම්, උසස්වීම් ලබාදීම සිදු නොකළ යුතුය.

පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රාජ්‍ය නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් පාර්ලිමේන්තු මැතිවරණ කාලසීමාව අවසන් වන තුරු අත්හිටුවිය යුතු අතර මැතිවරණ රාජකාරි සඳහා යොදා නොගන්නා රජයේ නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ වාර්ෂිකව සිදු කෙරෙන සාමාන්‍ය ස්ථාන මාරුවීම් වුව ද ක්‍රියාත්මක කළ යුත්තේ මැතිවරණ කොමිෂන් සභාවේ නැතහොත් මැතිවරණ කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව පමණි. වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා කෙරෙන ස්ථාන මාරුවීම්, නිලධාරීන් අතර කෙරෙන සුහද මාරුවීම්, විනයානුකූල හේතු මත කෙරෙන ස්ථාන මාරුවීම්, අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කෙරෙන ස්ථාන මාරුවීම් මැතිවරණ කොමසාරිස්ගේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කළ හැකි අතර එවැනි ස්ථාන මාරුවීම් දේශපාලන හේතු මත සිදු වූ බවට පැමිණිලි නොලැබිය යුතුය. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු/රාජ්‍ය විශ්වවිද්‍යාල, රාජ්‍ය සමාගම් වැනි රාජ්‍ය ආයතනවල සේවය කරනු ලබන මැතිවරණ රාජකාරි සඳහා යොදවා නොගන්නා නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීම් දේශපාලන හේතූන් මත සිදු කළ බවට පැමිණිලි නොලැබෙන සේ සිදු කිරීමට වගබලා ගත යුතුය. මෙම කාල සීමාව තුළ සිදු කෙරෙන කිසිදු ආකාරයක පත්කිරීමක්, උසස් කිරීමක් හෝ ස්ථාන මාරුවීමක් මැතිවරණ නීති උල්ලංඝණය වන පරිදි හෝ මැතිවරණ ක්‍රියාදාමයට බාධා වන පරිදි සිදු නොකිරීම විෂයභාර නිලධාරීන්ගේ වගකීම වන්නේය.

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය බැංකු/රාජ්‍ය විශ්වවිද්‍යාල, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සමාගම්/සන්නද්ධ හමුදා ඇතුළු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් සෑම ආයතනයකම සේවයේ නියුතු අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධාරීන් දේශපාලන කටයුතුවලින් සම්පූර්ණයෙන්ම බැහැර විය යුතු අතර දේශපාලන අයිතීන් හිමි නිලධාරීන් වුව ද කාර්යාල වේලාවන් තුළ හෝ රාජකාරි නිවාඩු මත හෝ දේශපාලන කටයුතුවල නිරත නොවිය යුතුය. තවද රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන් ද ඇතුළු එකී ආයතනවල නිත්‍ය කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරුධාරීන් ද කාර්යාල වේලාව තුළ රාජකාරී නිවාඩු ලබාගෙන හෝ රාජ්‍ය දේපළ භාවිතා කරමින් හෝ රාජකාරි කටයුතු මුවාවෙන් හෝ පක්ෂයක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමේ හෝ කිසියම් පක්ෂයකට හෝ අපේක්ෂකයකුට එරෙහිව ක්‍රියා කිරීම හෝ නොකළ යුතුය.

මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීම පිණිස සිදු කරනු ලබන නිලධාරීන් සහ වාහන සංගණනයේ දී ස්වකීය ආයතනවල සියලුම නිලධාරීන්ගේ, විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ තොරතුරු හා ස්වකීය ආයතන සතු වාහන පිළිබඳ විස්තර සැපයීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර සියලුම නිලධාරීන්, විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් තමන්ගේ තොරතුරු අවස්ථාවෝචිත පරිදි මැතිවරණ කොමසාරිස් වෙත හෝ තේරීම්භාර නිලධාරී වෙත ඉදිරිපත් කිරීමට බැඳී සිටී.

මැතිවරණ රාජකාරි සඳහා සේවයේ යෙදවීමට සුදුසුකම් ඇති සියලුම රජයේ නිලධාරීන්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන්, තේරීම්භාර නිලධාරීන් විසින් සේවා අවශ්‍යතා අනුව මැතිවරණ රාජකාරිවල නිරත කරවනු ලැබෙනු ඇති අතර එසේ මැතිවරණ රාජකාරි සඳහා කැඳවනු ලබන සියලුම නිලධාරීන්, විදුහල්පතිවරු හා ගුරුවරුන් තමන් වෙත පැවරෙන රාජකාරි පැහැර හැරීමෙන් තොරව ඉටු කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්, තේරීම්භාර නිලධාරීන් විසින් නියම කරන පරිදි සේවයේ නිරත විය යුතුය.

මැතිවරණ දිනයේදී පමණක් නොව මැතිවරණයට අදාළ මූලික සංවිධාන කටයුතු සඳහා ද රජයේ ආයතනවල නිලධාරීන්, වාහන, උපකරණ හා වෙනත් සැපයුම් සේවා, මැතිවරණ කොමිෂන් සභාවට නැතහොත් මැතිවරණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන හෙයින් එකී අවශ්‍යතා සපුරාලීමට රජයේ/රජයේ ආයතනවල ප්‍රධානීන් බැඳී සිටී.

පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළ සියලුම නීති බලාත්මක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට/මැතිවරණ කොමසාරිස්වරයාට සහාය දැක්වීමට අපොහොසත් වන අදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන් සම්බන්ධව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උ උ ව්‍යවස්ථාවෙහි සඳහන් පරිදි කටයුතු කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.